මගේ අංකය: JSC/SEC/CIR – L/ 2023

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 06/2023**

**සියලුම මහේස්ත්‍රාත්වරුන් සහ සියලුම අතිරේක මහේස්ත්‍රාත්වරුන් වෙත,**

**කම්කරු නීතියට හඳුන්වාදුන් නවතම සංශෝධන පනත් වන 2022 අංක 22 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනතේ සහ 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතේ දැක්වෙන විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙනි.**

ශීර්ෂගත කරුණට අදාලව කම්කරු කොමසාරිස් ජනරාල් බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා විසින් මා අමතා ඇති අංක: **PB/CGL/පොදු /V** හා 2022.10.19 දිනැති ලිපිය හා ඒ සමඟ අමුණා තිබූ උක්ත ශීර්ෂයේ සඳහන් සංශෝධන පනත් පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, ඔබ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරුන්ගේ අවධානයට ලක්කරනු පිණිස එම ලිපිය සහ එම සංශෝධන පනත් අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කරන ලෙසට මට නියම කර ඇත.

02. ඒ අනුව, එම ලිපිය හා ඇමුණුම් අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කොට ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2023 මාර්තු මස 22 වන දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

කම්කරු දෙපාර්තමේන්තුව
தொழில் திணைக்களம்
DEPARTMENT OF LABOUR

කම්කරු මහ ලේකම් කාර්යාලය අංක 41, කිරුල පාර, කොළඹ - 05, ශ්‍රී ලංකාව.
தொழிற் செயலகம், இல.41,கிருள வீதி, கொழும்பு 05, இலங்கை.
Labour Secretariat, No. 41, Kirula Road, Colombo - 05, Sri Lanka.

මගේ අංකය : / எனது இலக்கம் : / My No : PB/CGL/පොදු/V

ඔබේ අංකය : / உமது இலக்கம் : / Your No :

දිනය / திகதி / Date:2022.10.19

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

**කම්කරු නීතියට හඳුන්වා දුන් නවතම සංශෝධන පනත් වන 2022 අංක 22 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනතේ සහ 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන)(සංශෝධන) පනතේ දැක්වෙන විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙනි.**

කම්කරු නීතියට මෑතකාලීනව හඳුන්වාදෙනු ලැබූ සංශෝධන පනත් වන 2022 අංක 22 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනත සහ 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත 2022.09.16 දින සිට ක්‍රියාත්මක වේ.

02. ඒ අනුව, පහත 02 (I) හා (II) ඡේදවල සඳහන් කරනු ලබන නෛතික ප්‍රතිපාදන වල දැක්වෙන පරිදි මහේස්ත්‍රාත් අධිකරණයකින් ලබාදෙන තීන්දුවකට එරෙහිව නැවත සේවායෝජක විසින් මහාධිකරණයට ප්‍රතිශෝධන අයදුම්පතක් ඉදිරිපත් කරන අවස්ථාවක ගත යුතු පියවර සම්බන්ධයෙන් දිවයින පුරා පිහිටි මහේස්ත්‍රාත් අධිකරණ වල සිටින රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

I. **2022 අංක 22 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනත**

a) පනතේ 4 වන වගන්තිය යටතේ වූ 33අ (1) උප වගන්තියෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නියෝගයක් බලාත්මක කිරීමට නඩු පැවරීමකදී ප්‍රශ්නගත නියෝගය සම්බන්ධව කම්කරු කොමසාරිස්වරයාට පක්ෂව මහේස්ත්‍රාත් අධිකරණයකින් ලබාදෙන තීන්දුවකට එරෙහිව නැවත සේවායෝජක විසින් මහාධිකරණයට ප්‍රතිශෝධන අයදුම්පතක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, ප්‍රශ්නගත නියෝගයට අදාලව මහේස්ත්‍රාත්වරයා ලබාදුන් නියෝගයේ යම් මුදලක් සඳහන් වන විට එම මුදල ඇපයක් ලෙස මහේස්ත්‍රාත් අධිකරණයේ තැන්පත් කිරීමෙන් පසු ප්‍රතිශෝධන අයදුම්පත සේවායෝජක විසින් ගොනු කිරීමට කටයුතු කළ යුතු ය.

b) පනතේ 4 වන වගන්තිය යටතේ වූ 33අ(2) උප වගන්තිය අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඇප මුදල් ලෙස ඉදිරිපත් කරන සියලු මුදල් ශ්‍රී ලංකාවේ අනුමත යම් බැංකුවක කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොළී දරන ගිණුමක තැන්පත් කිරීම පිණිස කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීමට කටයුතු කළ යුතු ය .



Telephone Nos - 011 2581142-3-6 011 2369373
Fax - 011 2581145
P.O. Box - 575
E-Mail : cgldol@sltnet.lk
Web : www.labourdept.gov.lk

c) පනතේ 4 වන වගන්තිය යටතේ වූ 33අ (3) උප වගන්තිය අනුව ඇප මුදල යථා පරිදි ඉදිරිපත් කර ඇති බවට අදාල මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කළ යුතු ය.

**II. 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත**

a) පනතේ 4 වන වගන්තිය යටතේ වූ 10අ(1) හා (2) උප වගන්ති ප්‍රකාරව කම්කරු කොමසාරිස්වරයාට පක්ෂව මහේස්ත්‍රාත් අධිකරණයකින් ලබාදෙන තීන්දුවකට එරෙහිව නැවත සේවායෝජක විසින් මහාධිකරණයට ප්‍රතිශෝධන අයදුම්පතක් ඉදිරිපත් කරන අවස්ථාවක, ප්‍රශ්නගත නියෝගයට අදාලව මහේස්ත්‍රාත්වරයා ලබාදුන් නියෝගයේ යම් මුදලක් සඳහන් වන විට එම මුදල ඇපයක් ලෙස මහේස්ත්‍රාත් අධිකරණයේ තැන්පත් කිරීමෙන් පසු ප්‍රතිශෝධන අයදුම්පත සේවායෝජක විසින් ගොනු කිරීම සිදු කළ යුතු ය.

b) පනතේ 4 වන වගන්තිය යටතේ වූ 10අ(3) උප වගන්තිය අනුව ඇප මුදල යථා පරිදි ඉදිරිපත් කර ඇති බවට අදාල මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කළ යුතු ය.

c) පනතේ 4 වන වගන්තිය යටතේ වූ 10අ(4) උප වගන්තියට අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඇප මුදල් ලෙස ඉදිරිපත් කරන සියලු මුදල් ශ්‍රී ලංකාවේ අනුමත යම් බැංකුවක කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොළී දරන ගිණුමක තැන්පත් කිරීම පිණිස කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීමට කටයුතු කළ යුතු ය.

03. එසේම, කාර්මික ආරවුල් පනත යටතේ යොමු කරන කාර්මික ආරවුලක් සම්බන්ධව බේරුම්කරුවෙකු/කාර්මික අධිකරණයක් විසින් ලබාදෙන ප්‍රදානයක් හෝ සේවය අවසන් කිරීමේ පනතේ 6 හා 6අ වගන්තිය යටතේ කම්කරු කොමසාරිස්වරයා විසින් ලබාදෙන නියෝගයක්, යම් සේවායෝජකයෙකු විසින් රිට් ආඥාවක් මඟින් අභියෝගයට ලක්කිරීමට අවසර ඉල්ලා සිටින අවස්ථාවක නව සංශෝධන පනත් හි දැක්වෙන ප්‍රතිපාදන ප්‍රකාරව පහත අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු ය.

I. 2022 අංක 22 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනතේ 3 වන වගන්තිය යටතේ වූ 31 ඈඈඈඈ (1) උප වගන්තියේ දැක්වෙන ප්‍රතිපාදන අනුව කාර්මික ආරවුල් පනත යටතේ යොමු කරන කාර්මික ආරවුලක් සම්බන්ධව බේරුම්කරුවෙකු හෝ කාර්මික අධිකරණයක් විසින් ලබාදෙන ප්‍රදානයකට එරෙහිව යම් සේවායෝජකයෙකු විසින් රිට් ආඥාවක් නිකුත් කරනු ලැබීම සඳහා අභියාචනාධිකරණයට කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් සේවායෝජක විසින් ඇප මුදලක් කම්කරු කොමසාරිස් ජනරාල් වෙත තැන්පත් කිරීමෙන් පසු සලකා බැලීමට අවකාශය සලසා දී ඇති බැවින්, පනතේ 3 වන වගන්තිය යටතේ වූ 31 ඈඈඈඈ (3) උප වගන්තියට අනුව නියමිත ඇප මුදල එම සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා ස්වකීය අත්සනින් සහතිකයක් නිකුත් කර තිබිය යුතු ය.

II. 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතේ 4 වන වගන්තිය යටතේ වූ 10ආ (1) හා (2) උප වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුලත් කර ඇති අතර, එම ප්‍රතිපාදන ප්‍රකාරව සේවය අවසන් කිරීමේ පනතේ 6 හා 6අ වගන්තිය යටතේ කම්කරු කොමසාරිස්වරයා විසින් ලබාදෙන නියෝගයකට එරෙහිව යම් සේවායෝජකයෙකු විසින් රිට් ආඥාවක් නිකුත් කරගනු ලැබීම සඳහා අභියාචනාධිකරණයට කරනු ලබන ඉල්ලීමකට අදාල ක්‍රියාමාර්ග එම සේවායෝජක විසින් පනතේ සඳහන් පරිදි ගණනය කරන ලද ඇප මුදලක් කම්කරු කොමසාරිස් ජනරාල් වෙත තැන්පත් කිරීමෙන් පසු සිදු කළ යුතු බැවින් පනතේ 10ආ(3) උප වගන්තිය පරිදි නියමිත ඇප මුදල එම සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා ස්වකීය අත්සනින් සහතිකයක් නිකුත් කර තිබිය යුතු ය.

04. ඒ අනුව, ඉහත 03 (I) හා (II) ඡේදයේ දැක්වෙන පරිදි යම් සේවායෝජකයෙකු විසින් ඇප මුදල් නිසි පරිදි ඉදිරිපත් කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයාගේ අත්සනින් යුත් සහතිකය ඉදිරිපත් නොකරන අවස්ථාවක, රිට් ආඥාවක් ඉල්ලුම් කිරීමට අවසර ලබා නොදෙන ලෙසට අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර්වරයා ද දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

05. ඉහත දක්වන ලද ප්‍රතිපාදන සලකුණු කරන ලද 2022 අංක 22 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනතේ සහ 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතේ පිටපත් පිළිවෙලින් ඇමුණුම I හා ඇමුණුම II ලෙස නම් කර මේ සමඟ අමුණා අවශ්‍ය කටයුතු සඳහා කාරුණිකව යොමු කරමි.

බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති

කම්කරු කොමසාරිස් ජනරාල්

හිමියලු බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05

පිටපත :- ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය (කාරුණික දැනගැනීම පිණිස )

ඇමුණුම I

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2022 අංක 22 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 සැප්තැම්බර් මස 16 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල : රු. 15.00

තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2022 අංක 22 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 16 වන දින]

එල්.ඩී.—ඕ. 25/2021

(131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2022 අංක 22 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනතේ 31ඇඇ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

131 වන අධිකාරයේ 31ඇඇ වගන්තිය සංශෝධනය කිරීම

"(1අ) කම්කරු විනිශ්චය අධිකාරයක යම් ආඥාවකට එරෙහිව යම් කම්කරුවකු විසින් කරන ලද අභියාචනයක් මත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් මගින් එම කම්කරුවාට පක්ෂව දෙන ලද අවසාන තීන්දුවකින් අතෘප්තියට පත් සේවායෝජකයකු ඒ තීන්දුවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන අවස්ථාවක දී, එම අභියාචනයට විෂයය වන නියෝගය මඟින්-

(අ) කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස පමණක් විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන මුදලක ඇප මුදලක්; සහ

(ආ) කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස ද, එම කම්කරුවා නැවත සේවයේ පිහිටුවන ලෙස ද විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන මුදලක් සහ එම කම්කරුවාගේ සේවය අවසන් කරන ලද

අවස්ථාව වන විට එම කම්කරුවාගේ මාසික වැටුප හෝ වේතන මෙන් දොළොස් ගුණයක් වූ මුදලක ඇප මුදලක්,

සේවායෝජකයා විසින් ඒ විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(1ආ) (1අ) උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචනයක් ම, (1අ) උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල එම සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇති බවට කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(1ඇ) සෑම විනිශ්චය අධිකාරයක සභාපතිවරයකු විසින් ම, (1අ) උපවගන්තිය යටතේ ඇප මුදල් ලෙස ඉදිරිපත් කරනු ලබන සියලු මුදල් ශ්‍රී ලංකාවේ යම් අනුමත බැංකුවක පොලී දරන ගිණුමක තැන්පත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 31ඇඇඇඇඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇඇඇඇ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇඇඇඇඇ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"සේවායෝජකයා විසින් අභියාචනාධිකරණයට ඉදිරිපත් කරන ඉල්ලීමක් සම්බන්ධයෙන් ඇප මුදලක් ඉදිරිපත් කළ යුතු බව

31ඇඇඇඇඇ. (1) මේ පනතේ 17(1) වගන්තිය යටතේ බේරුම්කරුවකු විසින් හෝ 24 වන වගන්තිය යටතේ කාර්මික අධිකරණයක් විසින් කරන ලද ප්‍රදානයකට එරෙහිව රිට් ආඥාවක ස්වභාවයේ වූ ආඥාවක් නිකුත් කරනු ලැබීම සඳහා සේවායෝජකයකු විසින් අභියාචනාධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවක දී, ඒ ඉල්ලීමට විෂයය වන්නා වූ ප්‍රදානය මඟින් කම්කරුවාට යම් මුදලක් ගෙවීමට නියම කරනු ලබන අවස්ථාවක දී, සේවායෝජකයා විසින් ඒ මුදලට සමාන මුදලක ඇප මුදලක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු අභියාචනාධිකරණය විසින් ඒ ඉල්ලීම සලකා බලනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල් ශ්‍රී ලංකාවේ අනුමත යම් බැංකුවක කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොලී දරන ගිණුමක තැන්පත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) මේ උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල ඒ සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මගින් සනාථ කරනු ලැබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 33අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියට 33අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

"මහාධිකරණයට කරන ඉල්ලීමක් සම්බන්ධයෙන් සේවායෝජකයා විසින් ඇප මුදලක් ඉදිරිපත් කළ යුතු බව

33අ. (1) යම් කම්කරුවකුට පක්ෂව කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කරන ලද ආඥාවක් හෝ කාර්මික අධිකරණයක හෝ බේරුම්කරුවකුගේ ප්‍රදානයක් අනුව කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් යම් සේවායෝජකයකුට එරෙහිව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136ආ වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද යම් ලිඛිත පැමිණිල්ලකට අනුව මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් දෙන ලද තීන්දුවක් මගින් අතෘප්තියට පත් සේවායෝජකයකු, ඒ තීන්දුව සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයේ ප්‍රතිශෝධන අධිකරණ බලය ලබා ගැනීමට ඉල්ලීමක් කරන අවස්ථාවක දී, එම ඉල්ලීමට විෂයය වන්නාවූ ආඥාව මගින් ඒ කම්කරුවාට යම් මුදලක් ගෙවීමට නියම කරනු ලබන අවස්ථාවේ දී සේවායෝජකයා විසින්, එම මුදලට සමාන මුදල් ප්‍රමාණයකින් වූ ඇප මුදලක් අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ ඇප මුදල් ලෙස ඉදිරිපත් කරන ලද සියලු මුදල්, ශ්‍රී ලංකාවේ අනුමත බැංකුවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොලී දරන යම් ගිණුමක තැන්පත් කරනු ලැබීම පිණිස කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල ඒ සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇති බවට අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසාන තීන්දුවට අනුකූලව, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද මුදල, ඒ මුදල මත වූ පොලිය ද සමඟ අදාළ පාර්ශ්වය වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

5. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.

ඇමුණුම II

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 සැප්තැම්බර් මස 16 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල : රු. 15.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 16 වන දින]

එල්.ඩී.—ඕ. 24/2021

**1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1971 අංක 45 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (3) වන උපවගන්තියේ "රුපියල් දහසකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් විසි දහසකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:—

"(3අ) (1) යම් සේවායෝජකයකු (3) වන උපවගන්තිය යටතේ වන වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා දෙන තීරණයකට අනුකූලව කටයුතු කිරීම ඔහු විසින් අඛණ්ඩව පැහැර හරිනු ලබන්නේ නම්, වරදකරු කරනු ලැබීමෙන් පසු, (3) වන උපවගන්තිය යටතේ පනවනු ලබන යම් දඩයකට අතිරේකව, එම තීරණයට අනුකූලව කටයුතු නොකිරීම අඛණ්ඩව කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක අතිරේක දඩයක් කම්කරුවාට ගෙවීමට එම සේවායෝජකයා යටත් විය යුතු ය.

(2) යම් සේවායෝජකයකු විසින්, (2) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ කම්කරුවකුට ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක, එම සේවායෝජකයා වරදකරු කරනු ලැබ ඇත්තේ කවර මහෙස්ත්‍රාත් අධිකරණයකින් ද, එම මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ඔහුට පනවන ලද දඩයක් ලෙස ඒ අධිකරණය විසින් කරනු ලබන ආඥාවක් මඟින් එම මුදල අයකරගනු ලැබිය හැකි අතර, එසේ අයකරගනු ලබන මුදල කම්කරුවාට ගෙවනු ලැබිය යුතු ය.”.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ “රුපියල් පනහක දඩයකට” යන වචන වෙනුවට “රුපියල් පන්සියයක දඩයකට” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ සහ 10ආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 10අ සහ 10ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

*“මහාධිකරණය වෙත කරන ඉල්ලීමක් සම්බන්ධයෙන් සේවායෝජකයා විසින් ඇප මුදලක් ඉදිරිපත් කළ යුතු බව*

10අ. (1) යම් සේවායෝජකයකු මහෙස්ත්‍රාත් අධිකරණය විසින් කරනු ලබන ආඥාවකින් අතෘප්තියට පත් වූ අවස්ථාවක, එම සේවායෝජකයා විසින්, එම මහෙස්ත්‍රාත් අධිකරණය පිහිටා ඇත්තේ යම් පළාතක් තුළ ද, එම පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත ඒ ආඥාවට එරෙහිව ලිඛිත පෙත්සමක් මඟින් ප්‍රතිශෝධන ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරන සෑම සේවායෝජකයකු විසින් ම, එම ඉල්ලීමට විෂයය වන ආඥාවෙන් කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන ඇප මුදලක් එම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, එම සේවායෝජකයා විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල යථා පරිදි ඉදිරිපත්කොට ඇති බවට අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(4) මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ ඇප මුදල් ලෙස ඉදිරිපත් කරනු ලබන සියලු මුදල්, ශ්‍රී ලංකාව තුළ අනුමත බැංකුවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන, පොළී දරන යම් ගිණුමක තැන්පත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට යැවීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

අභියාචනාධිකරණය වෙත කරන ඉල්ලීමක් සඳහා සේවායෝජකයා විසින් ඇප මුදලක් ඉදිරිපත් කළ යුතු බව

10ආ. (1) යම් සේවායෝජකයකු 6 වන හෝ 6අ වන වගන්ති යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද නියමයකින් අතෘප්තියට පත් වූ අවස්ථාවක, එම සේවායෝජකයා විසින් රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා එම නියමයට එරෙහිව අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරන සෑම සේවායෝජකයකු විසින් ම, එම ඉල්ලීමට විෂයය වන නියමය මඟින්-

(අ) වන්දි ලෙස යම් මුදලක් ගෙවන ලෙස ද, නැවත සේවයේ පිහිටුවන ලෙස ද, විධාන කරනු ලබන අවස්ථාවක, එම නියමයේ දින සිට එම කම්කරුවා නැවත සේවයේ පිහිටුවනු ලැබිය යුතු දින දක්වා ගණනය කළ යුතු වැටුප් හෝ වේතන ලෙස වන යම් මුදල් ප්‍රමාණයක් සහ නැවත සේවයේ පිහිටුවීම වෙනුවෙන් එම කම්කරුවාගේ මාසික වැටුප හෝ වේතන මෙන් දොළොස් ගුණයක් වූ මුදලක ඇප මුදලක්; සහ

(ආ) වන්දි ලෙස කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස පමණක් විධාන කරනු ලැබූ අවස්ථාවක, එම මුදලට සමාන මුදලක ඇප මුදලක්.

අභියාචනාධිකරණය වෙත තබනු ලැබිය යුතු ය.

(3) රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක්ම, එම සේවායෝජකයා විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල යථා පරිදි ඉදිරිපත්කොට ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් ස්වකීය අත්සන යටතේ නිකුත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණය, ශ්‍රී ලංකාව තුළ අනුමත යම් බැංකුවක කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොළී දරන ගිණුමක තැන්පත් කිරීම සඳහා කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(5) කොමසාරිස් ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, අභියාචනාධිකරණය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් වන අවසාන තීරණය ප්‍රකාර, (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඇප මුදල එම මුදලට අදාළ පොළිය ද සමඟ අදාළ පාර්ශ්වයට ආපසු ගෙවනු ලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම*

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ "රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් විසිදහසක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

6. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.

# PARLIAMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

---

## INDUSTRIAL DISPUTES (AMENDMENT) ACT, No. 22 OF 2022

---

**[Certified on 16th of September, 2022]**

*Printed on the Order of Government*

---

Published as a Supplement to Part II of the **Gazette of the Democratic Socialist Republic of Sri Lanka** of September 16, 2022

PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA

TO BE PURCHASED AT THE GOVERNMENT PUBLICATIONS BUREAU, COLOMBO 5

**Price : Rs. 15.00** **Postage : Rs. 15.00**

*This Act can be downloaded from* www.documents.gov.lk

*Industrial Disputes (Amendment)*
*Act, No. 22 of 2022*

[Certified on 16th of September, 2022]

L.D.-O. 25/2021

AN ACT TO AMEND THE INDUSTRIAL DISPUTES
ACT (CHAPTER 131)

BE it enacted by the Parliament of the Democratic Socialist Republic of Sri Lanka as follows:-

**1.** This Act may be cited as the Industrial Disputes (Amendment) Act, No. 22 of 2022. Short title

**2.** Section 31DD of the Industrial Disputes Act (Chapter 131) (hereinafter referred to as the "principal enactment") is hereby amended by the insertion immediately after subsection (1) of that section of the following new subsections:– Amendment of section 31DD of Chapter 131

"(1A) Where an employer who is dissatisfied with a final order of a High Court established under Article 154P of the Constitution which is in favour of a workman on an apeal made by such workman against any order of a tribunal, appeals to the Supreme Court against such order, he shall furnish to the President of such tribunal, a security in cash, where the order which is the subject of such appeal directs–

(*a*) only the payment of a sum of money to the workman of an amount equal to such sum;

(*b*) both the payment of a sum of money to the workman and re-instatement of such worker, of an amount equal to such sum and twelve times the monthly salary or wages of such workman at the time his services were terminated.

(1B) Every appeal preferred under subsection (1A), shall be supported by a certificate under the hand of the

President of the Tribunal to the effect that the security as specified in subsection (1A) has been duly furnished by the employer.

(1C) The President of every Tribunal shall cause all moneys furnished as security under subsection (1A) to be deposited in an account bearing interests, in any approved bank in Sri Lanka.".

Insertion of new section 31DDDDD in the principal enactment

**3.** The following new section is hereby inserted immediately after section 31DDDD of the principal enactment and shall have effect as section 31DDDDD of that enactment:–

"Employer to furnish a security in respect of an application to the Court of Appeal

31DDDDD. (1) Where an application is preferred by an employer to the Court of Appeal, for the issue of an order in the nature of a writ, against an award made by an arbitrator under section 17(1) or by an industrial court under section 24, the Court of Appeal shall entertain such application upon furnishing a securtiy by such employer, in cash to the Commissioner-General, where such award which is subject to such application directs the payment of a sum of money to the worker, of an amount equal to such sum.

(2) The Commissioner-General shall cause to be deposited the sum as specified in subsection (1) in an account bearing interests, maintained by the Commissioner-General, in any approved bank in Sri Lanka.

(3) Every application preferred under this subsection, shall be supported by a certificate under the hand of the Commissioner-General to the effect that the security as specifed in subsection (1) has been duly furnished by such employer.".

**4.** The following new section is hereby inserted immediately after section 33 of the principal enactment and shall have effect as section 33A of that enactment:– Insertion of section 33A in the principal enactment

"Employer to furnish a security in respect of an application to the High Court

33A. (1) Where an employer who is dissatisfied with an order of a Magistrate's Court on any written complaint made by the Commissioner-General under section 136B of the Code of Criminal Procedure Act, No. 15 of 1979 against such employer, due to any failure to comply with an order of a tribunal, an award of an industrial court or an arbitrator which has been made in favor of a workman, makes an application to invoke the revisionary jurisdiction of the High Court establisded under Article 154P of the Constitution, in respect of such order, shall at the time of such application furnish to the relevant Magistrate's Court, a security of an amount equal to such sum in cash, where the order which is the subject of such application directs the payment of a sum of money to the worker.

(2) The Registrar of the Magistrate's Court shall cause all moneys furnished as security under subsection (1), to be sent to the Commissioner-General to deposit in an account bearing interests, maintained by the Commissioner-General, in any approved bank in Sri Lanka.

(3) Every application made under subsection (1) shall be supported by a certificate under the hand of the Registrar of the relevant Magistrate's Court to the effect that the security as specified in subsection (1) has been duly furnished by such employer.

(4) The Commissioner-General shall refund the sum furnished under subsection (1) together with the interest on that sum to the relevant party in accordance with the final order of the High Court established under Article 154p, the Court of Appeal or the Supreme Court, as the case may be.".

Sinhala text to prevail in case of inconsistency

**5.** In the event of any inconsistency between the Sinhala and Tamil texts of this Act, the Sinhala text shall prevail.

English Acts of the Parliament can be purchased at the "Prakashana Piyasa", Department of Government Printing, No. 118, Dr. Danister De Silva Mawatha, Colombo 8.

# PARLIAMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

---

## TERMINATION OF EMPLOYMENT OF WORKMEN (SPECIAL PROVISIONS) (AMENDMENT) ACT, No. 23 OF 2022

---

**[Certified on 16th of September, 2022]**

*Printed on the Order of Government*

---

Published as a Supplement to Part II of the **Gazette of the Democratic Socialist Republic of Sri Lanka** of September 16, 2022

PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA

TO BE PURCHASED AT THE GOVERNMENT PUBLICATIONS BUREAU, COLOMBO 5

**Price : Rs. 15.00** **Postage : Rs. 15.00**

*This Act can be downloaded from* www.documents.gov.lk

*Termination of Employment of Workmen (Special Provisions) (Amendment) Act, No. 23 of 2022*

[Certified on 16th of September, 2022]

L.D.—O. 24/2021

AN ACT TO AMEND THE TERMINATION OF EMPLOYMENT OF WORKMEN (SPECIAL PROVISIONS) ACT, NO. 45 OF 1971

BE it enacted by the Parliament of the Democratic Socialist Republic of Sri Lanka as follows:—

Short title

**1.** This Act may be cited as the Termination of Employment of Workmen (Special Provisions) (Amendment) Act, No. 23 of 2022.

Amendment of section 2 of Act, No. 45 of 1971

**2.** Section 2 of the Termination of Employment of Workmen (Special Provisions) Act, No. 45 of 1971 (hereinafter referred to as the "principal enactment") is hereby amended as follows:—

(1) in subsection (3) thereof, by the substitution for the words "fine not exceeding one thousand rupees" of the words "fine not exceeding twenty thousand rupees";

(2) by the insertion immediately after subsection (3) thereof, of the following:–

"(3A) (1) Where an employer is convicted of an offence under subsection (3), such employer shall be liable, if he continuously fails to comply with the decision made by the Commissioner-General under subsection (2), to pay the workman, in addition to any fine imposed under subsection (3), an additional fine of five hundred rupees for each day on which the noncompliance is continued after the conviction.

(2) Where any employer fails to pay any sum payable to a workman under paragraph (*e*) of subsection (2), such amount may be recovered by

an order of a Magistrate's Court by which the employer was convicted as if it were a fine imposed on him by that court, and the amount recovered shall be paid to the workman.".

Amendment of section 8 of the principal enactment

**3.** Section 8 of the principal enactment is hereby amended in paragraph (*a*) of subsection (1) thereof, by the substitution for the words "a fine of fifty rupees" of the words "a fine of five hundred rupees".

Insertion of new sections 10A and 10B in the principal enactment

**4.** The following new sections are hereby inserted immediately after section 10 of the principal enactment and shall have effect as sections 10A and 10B of that enactment:—

"Employer to furnish a security in respect of an application to the High Court

10A. (1) Where an employer is dissatisfied with an order of the Magistrate's Court, such employer may make an application in revision by a written petition, against that order to the High Court established under Article 154P of the Constitution, to the Province within which such Magistrate's Court is situated.

(2) Every employer who makes an application under subsection (1) shall furnish to such Magistrate's Court, a security in cash where the order which is the subject of such application directs the payment of a sum of money to the workman, of an amount equal to such sum.

(3) Every application made under subsection (1) shall be supported by a certificate under the hand of the Registrar of the relevant Magistrate's Court, to the effect that the security as specified in subsection (2) has been duly furnished by such employer.

(4) The Registrar of the Magistrate's Court shall cause all such sum of money furnished as security under subsection (2), to be sent to the Commissioner General to deposit in an account bearing interest, maintained by the Commissioner General, in any approved bank in Sri Lanka.

Employer to furnish a security in respect of an application to the Court of Appeal

10B. (1) Where an employer is dissatisfied with an order made by Commissioner-General under section 6 or 6A, such employer may make an application to the Court of Appeal against such order for the issue of an order in the nature of a writ.

(2) Every employer who makes an application under subsection (1) for the issue of an order in the nature of a writ shall furnish to the Court of Appeal, a security in cash, where the order which is the subject of such application directs–

(*a*) both the payment of a sum of money as compensation and the reinstatment, of an amount of money, as salary or wages which is to be calculated from the date of such order to the date on which such workman shall be reinstated, and an amount of twelve times the monthly salary or wages of such workman for the reinstatement; and

(*b*) only the payment of a sum of money to the workman as compensation, of an amount equal to such sum.

(3) Every application for the issue of an order in the nature of a writ, made under subsection (1) shall be supported by a certificate under the hand of the Commissioner-General to the effect that the security as specified in subsection (2) has been duly furnished by such employer.

(4) The Commissioner-General shall cause to be deposited the sum as specified in subsection (2), in an account bearing interest, maintained by the Commissioner-General, in any approved bank in Sri Lanka.

(5) The Commissioner-General shall refund the sum furnished under subsection (2) together with the interest on such sum to the relevant party in terms of the final determination of the application to the Court of Appeal or the Superme Court, as the case may be.".

Amendment of section 14 of the principal enactment

**5.** Section 14 of the principal enactment is hereby amended by the substitution for the words "fine not exceeding one thousand rupees" of the words "fine not exceeding twenty thousand rupees".

Sinhala text to prevail in case of inconsistency

**6.** In the event of any inconsistency between the Sinhala and Tamil texts of this Act, the Sinhala text shall prevail.

English Acts of the Parliament can be purchased at the "Prakashana Piyasa", Department of Government Printing, No. 118, Dr. Danister De Silva Mawatha, Colombo 8.